# තනතුරු - ඇබෑර්තු

## කළුතර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | වයස් සීමාව | බඳවා ගැනීම | පළපුරුද්ද | කායික සුදුසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු - III | 01 | PL3-2016 රු.25,790- 10x270- 10 x300 - 10 x330 - 12 x 350- රු. 38,990 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.) | 1. පෞද්ගලික/ කුලීරථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු සාටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ " සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. | වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟිනි. | බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.) | 1. අවම උස අඩි පහක් (5') විය යුතුය.<br><br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය. |

| අනු. අංක | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | වයස් සීමාව | බඳවා ගැනීම | පළපුරුද්ද | කායික සුදුසුකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 04 | PL1-2016 රු. 24,250 -10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330- රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය) | අදාළ නැත | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් දෙනු ලැබේ. | අදාළ නැත | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාව යෙන් යුක්ත විය යුතුය. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;

(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;

(iv) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ;

(v) දන්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය;

(vi) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතුය;

(vii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුරු ස්ථිරය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයන් අවුරුදු 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ;

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

මෙම බඳවා ගැනීම් කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලට ද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්කළ යුතු ආකාරය* :-

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2018.11.30 වැනි දිනට පෙර "ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව, ගාලු පාර, වස්කඩුව." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(i) අයදුම්පත බහාලන කවරයේ වම්පස දකුණු කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(ii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පාසැල් හැර යාමේ සහතිකය,
4. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
5. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික.

05. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවාගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. සී. පී. වීරසේකර,
ලේකම්,
කළුතර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*කළුතර ප්‍රාදේශීය සභාව*

**.......................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :..................................................................

1. මුලකුරු වලින් හැඳින්වෙන නම :..................................................................

02. ස්ථිර ලිපිනය :..................................................................

03. උපන් දිනය :..................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :..................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. දුරකථන අංකය :..................................................................

07. විවාහක/අවිවාහක බව :..................................................................

08. අධ්‍යාපන සුදුසුකම් :..................................................................

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :......................................

8.2 අ. පො. ස. (සා.පෙළ) විභාගය :

(i) වර්ෂය:.................. මාසය:..................

(ii) විභාග අංකය:..................

(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය

(i) වර්ෂය :..................... මාසය :.....................

(ii) විභාග අංකය :.....................

(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :...................................................................

10. වෙනත් සුදුසුකම් :...................................................................

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද/නැත් ද යන වග :..................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව මම දනිමි.

......................................... ,

අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................

11 - 683